# <u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විනය පරීක්ෂණ නිලධාරීන්ගේ සංචිතයේ ලියාපදිංචි වීම සඳහා අයදුම්පත් කැඳවීම</u>

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විනය පාලනයට යටත් වන නිලධාරීන් විසින් සිදු කරනු ලබන ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමුවන උපලේඛනය යටතේ දැක්වෙන වැරදි පිළිබඳ විනය පාලන කටයුතු රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සෘජුවම සිදු කරනු ලබන අතර, ඒ සඳහා පවත්වාගෙන යන විනය පරීක්ෂණ නිලධාරීන්ගේ සංචිතයේ විනය පරීක්ෂණ නිලධාරීන් වශයෙන් ලියාපදිංචි වීමට කැමැත්තක් දක්වන පහත සඳහන් සුදුසුකම් ඇති, **<u>විශ්‍රාමික රාජ්‍ය නිලධාරීන්ගෙන්</u>** අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා මහේස්ත්‍රාත් හා දිසා විනිසුරු වැනි විශ්‍රාමික අධිකරණ නිලධාරීන්ටද අයදුම් කළ හැක. පරීක්ෂණ කටයුතු සඳහා රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2018 අනුව ගෙවීම් කරනු ලැබේ. අදාළ ඉල්ලුම්පත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවියෙන් බාගත කිරීමෙන් හෝ ලිපිනය සහිත මුද්දර ඇලවූ 9" X 4" ලියුම් කවරයක් පහත සඳහන් ලිපිනයට යොමු කිරීමෙන් හෝ ලබා ගත හැක.

**සුදුසුකම් :**

1) 2023.05.02 දිනට විශ්‍රාමික නිලධාරීන්ගේ වයස අවුරුදු 75 ට අඩු වීම.
2) රාජ්‍ය සේවයේ/අධිකරණ සේවයේ මාණ්ඩලික නිලධාරියකු වශයෙන් දස අවුරුදු සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.
3) සිය සේවා කාලය තුළ දී ආයතන සංග්‍රහය යටතේ දැක්වෙන වරදකට විනය දඬුවමක් ලබා නොතිබීම.

ඉහත සුදුසුකම් සපුරා ඇති, විනය පරීක්ෂණ නිලධාරි සංචිතයේ ලියාපදිංචි වීමට කැමැත්තක් දක්වන නිලධාරීන් මෙම කාර්යාලයෙන් හෝ නිල වෙබ් අඩවියෙන් ලබාගත් අයදුම්පත් නිසි පරිදි සම්පූර්ණ කර විශ්‍රාම ගැන්වීම අනුමත කළ ලිපියේ පිටපතක් හා විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයේ පිටපතක් සමඟ පහත දැක්වෙන <u>ලිපිනය හෝ විද්‍යුත් තැපෑලට</u> 2023.05.02 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ එවිය යුතුය. අයදුම්පත් බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ " **විනය පරීක්ෂණ නිලධාරී සංචිතයේ ලියා පදිංචි වීම"** යනුවෙන් සඳහන් කරන්න.

**ලිපිනය** : ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක.1200/9,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල

**වෙබ් අඩවිය** : www.psc.gov.lk
**විද්‍යුත් තැපැල :** info@psc.gov.lk

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

තනුජා මුරුගේෂන්
වැඩ බලන ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**<u>රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විනය පරීක්ෂණ නිලධාරී සංචිතය සඳහා නිලධාරීන් ලියාපදිංචි කර ගැනීමේ අයදුම් පත්‍රය</u>**

**<u>(විශ්‍රාමික රාජ්‍ය හෝ අධිකරණ නිලධාරීන්)</u>**

1. මුලකුරු සමඟ නම : ..................................................................
2. මුලකුරුවලින් හැඳින්වෙන නම : ..................................................................

..................................................................

3. උපන් දිනය : ..................................................................
4. අයදුම්පත් භාර ගන්නා දිනට වයස : ..................................................................
5. ජාතික හැඳුනුම්පත් අංකය : ..................................................................
6. පෞද්ගලික ලිපිනය : ..................................................................

..................................................................

7. දිස්ත්‍රික්කය : ..................................................................
8. දුරකථන අංකය : ජංගම : ……………........………………......

ස්ථාවර : ……………….....…...………….......

9. මුල් පත්වීම් දිනය : ..................................................................
10. විශ්‍රාම ගත් දිනය : ..................................................................

(විශ්‍රාම ගැන්වීම අනුමත කළ ලිපියේ පිටපතක් හා විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයේ පිටපතක් අමුණන්න)

10.1 විශ්‍රාම ගන්නා විට දරමින් සිටි තනතුර : ..................................................................

10.2 සේවය හා ශ්‍රේණිය : ..................................................................

10.3 සේවා ස්ථානය : ..................................................................

10.4 අවසන් වරට ලබා ගත් වැටුප : ..................................................................

11. කලින් දැරූ තනතුරු

(අවසන් වරට දැරූ තනතුර මුලින් සඳහන් කරන්න. ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් අමතර කොළයක් අමුණන්න.)

| | තනතුර | සේවා ස්ථානය | කාලය |
|---|---|---|---|
| 1 | | | |
| 2 | | | |
| 3 | | | |
| 4 | | | |
| 5 | | | |

12. විනය පරීක්ෂණ මෙහෙය විය හැකි භාෂාව

(අදාළ කොටුවේ හෝ කොටුවල "√"ලකුණ යොදන්න)

| | | | | | |
|---|---|---|---|---|---|
| සිංහල | | දෙමළ | | ඉංග්‍රීසි | |

13. විනය පරීක්ෂණ මෙහෙය විය හැකි දිස්ත්‍රික්ක :..........................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

14. ඔබගේ සේවා කාලය තුළ ආයතන සංග්‍රහයේ II කාණ්ඩය යටතේ වැරදිකරුවකු වී තිබේද?
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

15. විනය පරීක්ෂණ පැවැත්වීමේ පළපුරුද්ද (ඉඩකඩ ප්‍රමාණවත් නොවේ නම් අමතර කොළයක් අමුණන්න.) : ..........................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

16. නීතිඥයෙකු වශයෙන් සුදුසුකම්/පළපුරුද්ද ඇත්නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න.

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

මා විසින් සපයන ලද ඉහත තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

........................................ ........................................

දිනය අයදුම්කරුගේ අත්සන